සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

TO BE PUBLISHED IN THE WEBSITE OF DOE

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

# ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ 2 වන පන්තියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2018

## (01) පාසල් පරිපාලනය හා අධීක්ෂණය

පැ තුනයි

පළමුවන ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

**1.** පහත සඳහන් එක් එක් ප්‍රශ්නයට **කෙටි පිළිතුරු** සපයන්න.

(i) පවත්වා ගනු ලබන ශ්‍රේණි හා විෂය ධාරා අනුව ශ්‍රී ලංකාවේ රජයේ පාසල් වර්ග **හතර** නම් කරන්න.

(ii) පාසල් කාල සටහන සැකසීම සඳහා ලබා ගන්නා ගුරු විස්තර සම්බන්ධ තොරතුරු **හතරක්** ලියන්න.

(iii) පාසල් මට්ටමේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය සඳහා පාසල තුළ ස්ථාපනය කළ යුතු කමිටු කවරේ දැයි දක්වන්න.

(iv) පාසල හා සම්බන්ධ අභ්‍යන්තර හා බාහිර පාර්ශ්වකරුවන් දෙදෙනා බැගින් නම් කරන්න.

(v) පාසල හා ජනසමාජය අතර සම්බන්ධතා දියුණු කිරීම සඳහා පාසල මගින් ක්‍රියාත්මක කළ හැකි ක්‍රියාකාරකම් **හතරක්** දක්වන්න.

(vi) විදුහල්පතිවරයෙකු වශයෙන් ප්‍රගුණ කර ගතයුතු කළමනාකරණ කුසලතා **හතරක්** සඳහන් කරන්න.

(vii) පාසලේ අභ්‍යන්තර අධීක්ෂණය සඳහා යොදා ගත හැකි ක්‍රම ශිල්ප **හතරක්** ලියන්න.

(viii) ශිෂ්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් විදුහල්පති වෙත පැවරී ඇති වගකීම් **හතරක්** දක්වන්න.

(ix) පාසල් පාදක කළමනාකරණය සඳහා වන පාසල් නගා සිටුවීමේ වැඩසටහන යටතේ පාසලේ අවශ්‍යතාව අනුව පිහිටු විය හැකි උපකමිටු **හතරක්** නම් කරන්න.

(x) ප්‍රාථමික අධ්‍යාපනය හා ද්විතීයික අධ්‍යාපනයට සම්බන්ධ විෂය මාලාවන් හි (ප්‍රාථමික විෂයමාලාව හා ද්විතීයික විෂයමාලාව) ප්‍රධාන ලක්ෂණ දෙක බැගින් ලියන්න.

*(ලකුණු 04 × 10 = 40 යි)*

**2.** (i) පාසල පදනම් කරගත් තක්සේරුකරණ වැඩ පිළිවෙළ පාසල තුළ ක්‍රියාත්මක කිරීම සඳහා විදුහල්පති විසින් කටයුතු කළ යුතු ආකාරය දක්වන්න.

(ii) "පාසල පදනම් කරගත් තක්සේරුකරණය යනු තවත් එක් ලිඛිත පරීක්ෂණයක් නොවේ."
ඒ අනුව ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියේ දී තක්සේරුකරණය සඳහා යොදා ගත හැකි විවිධ ක්‍රියාකාරකම් අතරින් **පහක්** නම් කරන්න.

(iii) ගුරුවරුන් විසින් පාසල් මට්ටමෙන් විවිධ ව්‍යාපෘති ක්‍රියාත්මක කරන අතර විදුහල්පති වශයෙන් ඔබ ඒ සඳහා මාර්ගෝපදේශකත්වය ලබාදීම වැදගත් වේ. ව්‍යාපෘතියක අන්තර්ගත විය යුතු යැයි සැළකෙන කරුණු **පහක්** දක්වන්න.

*(ලකුණු 15 යි)*

**3.** (i) 'අධීක්ෂණය හුදෙක් අඩුපාඩු සෙවීම සඳහා ය.' යන ඍණාත්මක ආකල්පය බැහැර කරමින් පාසල් අධ්‍යාපනයේ ගුණාත්මකභාවය තහවුරු කිරීම සඳහා හඳුන්වා දී ඇති නිර්ණායක, දර්ශක හා ප්‍රමිති පාදක ඇගයීම් වැඩපිළිවෙල පිළිබඳ ව කෙටියෙන් විස්තර කරන්න.

(ii) එම ඇගයීම් වැඩපිළිවෙලෙහි අන්තර්ගත ඇගයීම් ක්ෂේත්‍ර අටෙන් **පහක්** නම් කරන්න.

(iii) අභ්‍යන්තර හා බාහිර ඇගයීම් ක්‍රියාත්මක කිරීමේ දී පාසලෙහි කාර්යභාරය (පාසල් මට්ටමේ කාර්යභාරය) කවරේ දැයි දක්වන්න.

*(ලකුණු 15 යි)*



Department of Examinations, Sri Lanka

TO BE PUBLISHED IN
THE WEBSITE OF DOE



**4.** (i) "පාසල තුළ තෘප්තිමත් ගුරු මණ්ඩලයක් සිටීමෙන් අපේක්ෂිත ඉලක්ක ළඟා කර ගැනීම පහසු වේ." ගුරුවරුන් තෘප්තිමත් කිරීම සඳහා විදුහල්පතිවරයා ලෙස ඔබ අනුගමනය කරන ක්‍රමවේද **පහක්** ලියන්න.

(ii) ගුරු සුබසාධනය සඳහා පාසල් මට්ටමෙන් ක්‍රියාත්මක කළ හැකි සේවා **තුනක්** නම් කර, ගුරු සුබසාධනයෙහි ඇති වාසි දෙකක් ලියන්න.

(iii) ගුරුවරයාගේ වෘත්තීමය සංවර්ධන අවශ්‍යතා අනුව/ගුරු සංවර්ධන අවශ්‍යතා අනුව පාසල් පාදකව වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ දී විදුහල්පති විසින් අනුගමනය කරන ක්‍රියාමාර්ග කවරේ දැයි දක්වන්න.

*(ලකුණු 15 යි)*

**5.** (i) පාසල් පාදක කළමනාකරණය යටතේ පාසල් මට්ටමේ සාමූහික තීරණ ගැනීම හා ක්‍රියාත්මක කිරීම බලගන්වා ඇති ආකාරය පැහැදිලි කරන්න.

(ii) පාසල් කළමනාකරණ කමිටුවේ සංයුතිය දක්වන්න.

(iii) පාසල් කළමනාකරණ කමිටුවේ කාර්යභාරය සැකෙවින් දක්වන්න.

*(ලකුණු 15 යි)*

**6.** (i) පාසලට ලැබෙන භාණ්ඩ, බඩු වට්ටෝරු පොත්වල සටහන් කිරීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු **පහක්** දක්වන්න.

(ii) බඩු වට්ටෝරු පොතෙන් භාණ්ඩ ඉවත් කළ හැකි අවස්ථා කවරේ දැයි සඳහන් කරන්න.

(iii) බඩු වට්ටෝරු පොත් තුලනය කරන ආකාරය සැකෙවින් දක්වන්න.

*(ලකුණු 15 යි)*

**7.** පහත සඳහන් එකිනෙක අතර පවතින වෙනස, උදාහරණ දක්වමින් පැහැදිලි කරන්න.

(i) පූර්ණ විෂයමාලාව සහ විෂය සමගාමී විෂයමාලාව

(ii) වෙළඳපොළ මිල සැඳහුම් ක්‍රමය සහ සෘජු කොන්ත්‍රාත් ක්‍රමය

(iii) විදුහල්පතිගේ පරිපාලනමය අධීක්ෂණය සහ ඉගෙනුම්-ඉගැන්වීම් අධීක්ෂණය

(iv) සම්භවන ඇගයීම සහ සම්පිණ්ඩිත ඇගයීම

(v) අධිකාරී නායක ශෛලිය (ඒකාධිපති නායක ශෛලිය) හා සහභාගීත්ව නායක ශෛලිය

*(ලකුණු 03 × 5 = 15 යි)*

***

Department of Examinations, Sri Lanka

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ 2 වන පන්තියේ නිලධාරීන් සඳහා වන
කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2018

## (02) පාසල් සැලසුම්කරණය

පැ තුනයි

**පළමුවන ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.**

**1.** පහත සඳහන් එක් එක් ප්‍රශ්නයට කෙටි පිළිතුරු සපයන්න.

(i) පාසල් සැලසුම් සැකසීමේ දී සහභාගිත්ව කළමනාකරණ ප්‍රවේශය භාවිත කරනු ලැබේ. මෙම ප්‍රවේශය යටතේ පාසලේ සැලසුම් සැකසීමේ දී සහභාගි කරගනු ලබන පාර්ශ්වකරුවන් හතරක් සඳහන් කරන්න.

(ii) පාසලක් සඳහා දැක්මක් ගොඩ නැගීමේ දී එහි තිබිය යුතු ලක්ෂණ දෙකක් නම් කරන්න.

(iii) විදුහල්පතිවරයාට පාසලේ සිසුන් සම්බන්ධව තොරතුරු ලබා ගැනීම සඳහා රැස්කළයුතු දත්ත හතරක් සඳහන් කරන්න.

(iv) පාසල් මට්ටමින් රැස්කරන ලද දත්ත ක්‍රියාවලියකට භාජනය කිරීමෙන් පසුව තොරතුරු ලබාදෙනු ලැබේ. එලෙස ලබා දෙනු ලබන තොරතුරු හතරක් සඳහන් කරන්න.

(v) අධ්‍යාපන ආංශික සංවර්ධන උපාය මාර්ගික සැලසුම්කරණ වැඩ සටහනේ (ESDSP) 2018-2025 යටතේ පාසල් මට්ටමින් සැලසුම් සැකසීමට හඳුන්වා දෙනු ලබන තේමා හතර සඳහන් කරන්න.

(vi) පාසල්වල වාර්ෂික සැලසුම් ක්‍රියාත්මක කිරීමේ දී විදුහල්පති විසින් කළ යුතු කාර්ය හතරක් සඳහන් කරන්න.

(vii) පාසල් සැලසුම් සැකසීමේ දී නිවැරදි අරමුණු ගොඩනැගිය යුතුවේ. මෙම අරමුණු "SMART" විය යුතු ය. මෙහි එක් එක් ඉංග්‍රීසි අකුරින් වෙන වෙනම අදහස් කරනු ලබන්නේ කුමක්දැයි සඳහන් කරන්න.

(viii) ප්‍රාදේශීය මට්ටමේ පාසල් සංවර්ධනය වීමේ ප්‍රතිඵලයක් වශයෙන්, අදාළ ප්‍රදේශයේ සංවර්ධනය වන ක්ෂේත්‍ර හතරක් සඳහන් කරන්න.

(ix) වාර්ෂික සැලසුමක අරමුණු සාක්ෂාත් කිරීම සඳහා ව්‍යාපෘති ක්‍රියාත්මක කරනු ලැබේ. මෙම ව්‍යාපෘතිවල අඩංගු විය යුතු කරුණු හතරක් දක්වන්න.

(x) සංවර්ධනයේ නියමුවකු වශයෙන් විදුහල්පතිවරයාට කළමනාකරණ භූමිකාවක් ක්‍රියාත්මක කිරීමට සිදුවේ. මෙම භූමිකාවේ ප්‍රධාන ක්‍රියාවලි හතර සඳහන් කරන්න.

*(ලකුණු 04 × 10 = 40 යි)*

**2.** (i) සහභාගිත්ව එළඹුම භාවිත කරමින් පාසල් පාදක සැලසුම්කරණය පාසල් මට්ටමින් සම්පාදනය කිරීමේ දී විදුහල්පතිවරයාට මුහුණදීමට සිදුවන ගැටලු තුනක් සඳහන් කරන්න.

(ii) පාසල් පාදක සැලසුම්කරණ සංකල්පය පාසල් මට්ටමින් සැලසුම් සැකසීමේ දී භාවිත වුවද එය අපේක්ෂිත මට්ටමට සිදු නොවන බව වැඩි දෙනෙකුගේ අදහස වේ. මෙය හේතු සඳහන් කරමින් විස්තර කරන්න.

(iii) පාසල් පාදක සැලසුම්කරණ ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම තුළින් අධ්‍යාපනයේ සාධාරණත්වයට ගැටලු සහගත තත්ත්වයක් ඇතිවිය හැකි ද? හේතු සහිතව විස්තර කරන්න.

*(ලකුණු 15 යි)*

**3.** (i) පාසල් මට්ටමින් පවත්වාගෙන යනු ලබන අධ්‍යාපන කළමනාකරණ තොරතුරු පද්ධතියේ තොරතුරු ප්‍රදර්ශනය කරන ආකාර තුනක් සඳහන් කරන්න.

(ii) පාසල්වල අධ්‍යාපන කළමනාකරණ තොරතුරු පද්ධතියක් නිසි අයුරු පවත්වා ගෙනයාමේ දී විදුහල්පති විසින් මුහුණ දෙන ගැටලු හතරක් සඳහන් කරන්න.

(iii) "පාසල් සැලසුම් සැකසීමට අධ්‍යාපන කළමනාකරණ තොරතුරු පද්ධතියක් පාසල්වල පවත්වා ගෙනයාම ඉතා වැදගත් වේ." මෙම ප්‍රකාශය හේතු සහිතව පැහැදිලි කරන්න.

*(ලකුණු 15 යි)*

[ 2 වන පිටුව බලන්න.

Department of Examinations, Sri Lanka

TO BE PUBLISHED IN THE WEBSITE OF DOE

**4.** (i) සැලසුම්කරණ ක්‍රියාවලියේ දී පාසලේ සැබෑ තත්ත්වය අධ්‍යයනය කළ යුතුව ඇත. ඒ සඳහා භාවිත කරනු ලබන "SWOT" විශ්ලේෂණයේ සලකා බලනු ලබන ක්ෂේත්‍ර **හතර** සඳහන් කරන්න.

(ii) SWOT විශ්ලේෂණයට අමතරව පාසලේ තත්ත්වය විශ්ලේෂණය සඳහා භාවිත කරනු ලබන ක්‍රමවේද **හතරක්** නම් කර, ඉන් **එකක්** පාසලේ ක්‍රියාත්මක කරන අයුරු විස්තර කරන්න.

(iii) අධ්‍යාපනයේ ගුණාත්මකබව සංවර්ධනය සඳහා ව්‍යාපෘතියක් යෝජනා කර එය පාසලේ සිදුකරන අයුරු ගාන්ට් (Gantt) සටහනක් භාවිතයෙන් විස්තර කරන්න.

*(ලකුණු 15 යි)*

**5.** (i) සංවර්ධනයේ නියමුවා වශයෙන් විදුහල්පතිවරයාට පාසල සඳහා සැලසුමක් සකස් කර එය ක්‍රියාත්මක කිරීම තුළින් පාසල සංවර්ධනය කළ හැකි වේ. මෙම සැලසුම සඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා සිදුකළ යුතු කාර්ය **හතරක්** සඳහන් කරන්න.

(ii) කෙටිකාලීන සහ දිගුකාලීන සැලසුම් අතර වෙනස පැහැදිලි කරන්න.

(iii) "13 වසරක සහතික කළ අධ්‍යාපනය සියලුම සිසුන්ට ලබා දීම මගින් ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනයක් සිදුකළ හැකි වේ." මෙම ප්‍රකාශය හේතු සහිතව විස්තර කරන්න.

*(ලකුණු 15 යි)*

**6.** (i) අධ්‍යාපන ආංශික සංවර්ධන උපායමාර්ග සැලසුම් (ESDSP) (2018-2025) දෙවන තේමාව සංවර්ධනය සඳහා පාසල් මට්ටමින් ක්‍රියාත්මක කළ හැකි ව්‍යාපෘති **දෙකක්** සඳහන් කරන්න.

(ii) ඉහත සඳහන් කරන ලද ව්‍යාපෘති දෙකෙන් **එකක්** සඳහා අරමුණු **දෙකක්** සඳහන් කරන්න.

(iii) විදුහල්පතිවරයෙක් ලෙස පාසල යහපාලන සංකල්පය අනුව කළමනාකරණය කිරීමේ දී කළ යුතු කාර්ය **තුනක්** හේතු සහිතව විස්තර කරන්න.

*(ලකුණු 15 යි)*

**7.** පහත සඳහන් සියලුම කොටස්වල කරුණු යුගල අතර පවතින සම්බන්ධතාව වෙන වෙනම කෙටියෙන් පැහැදිලි කරන්න.

(i) එක් අවුරුදු ක්‍රියාත්මක කිරීමේ සැලසුම සහ පෙරළුම් සැලසුම

(ii) දත්ත සහ තොරතුරු

(iii) අධ්‍යාපන දර්ශක සහ සැලසුම් නියාමනය

(iv) වාර්ෂික අයවැය සහ වාර්ෂික සැලසුම

(v) ව්‍යාපෘතිය සහ ගාන්ට් සටහන

*(ලකුණු 03 × 5 = 15 යි)*

* * *

Department of Examinations, Sri Lanka

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

# ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ 2 වන පන්තියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2018

## (03) අධ්‍යාපනයේ නව ප්‍රවණතා හා ව්‍යවහාර

පැ තුනයි

පළමුවන ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

---

**1.** පහත සඳහන් එක් එක් ප්‍රශ්නයට කෙටි පිළිතුරු සපයන්න.

(i) නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යටතේ 2017 වර්ෂයේ සිට ක්‍රියාත්මක වන 13 වසරක අඛණ්ඩ අධ්‍යාපන වැඩසටහන යටතේ අධ්‍යාපන ලේකම්ගේ අංක 37/2017 හා 2017.09.20 දාතම චක්‍රලේඛය අනුව ක්‍රියාත්මක වන විෂය ධාරාවේ ප්‍රධාන සංරචක නම් කරන්න.

(ii) පාසල් නායකත්ව හා කළමනාකරණය සඳහා වූ ජාතික නිපුණතා රාමුවට අනුව නිපුණතා වසම් (competency domain) කීයක් තිබේ ද?එම වසම් නම් කරන්න.

(iii) පාසලක ගුරු අවශ්‍යතාව තීරණය කිරීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය විසින් නිකුත් කොට ඇති දැනට බලපැවැත්වෙන චක්‍රලේඛය කුමක් ද? පාසලක ගුරු අවශ්‍යතාව තීරණය කිරීමේ දී සලකා බැලිය යුතු ප්‍රධාන සාධක තුනක් නම් කරන්න.

(iv) දැනට බලපැවැත්වෙන අනිවාර්ය අධ්‍යාපන නියෝග ක්‍රියාත්මක කිරීමට අදාළ අතිවිශේෂ ගැසට් නිවේදනය නිකුත් කර ඇත්තේ කුමන වර්ෂයේ ද? එම නියෝග යටතේ සියලුම ළමයින් අනිවාර්යයෙන් ම අධ්‍යාපනයට යොමු විය යුතු වයස් සීමාව කුමක් ද?

(v) 2017 වර්ෂයේ දී ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය සඳහා (පාසල් අධ්‍යාපනය හා උසස් අධ්‍යාපනය) දළ දේශීය නිෂ්පාදිතයෙන් (gross domestic product) වෙන් වූ ප්‍රතිශතය කොපමණ දැයි ලියන්න.

(vi) 2018 වර්ෂයේ සිට ගුරුවරුන්ගේ වෘත්තීය සංවර්ධනය අභිමුඛ කොටගත් පාසල් මට්ටමින් ක්‍රියාත්මක වන වැඩසටහන නම් කරන්න.

(vii) ජාත්‍යන්තර වශයෙන් අධ්‍යාපන ක්ෂේත්‍රයේ ප්‍රධාන විෂය ක්ෂේත්‍ර සමෝධානිතව ගෝලීය ඉල්ලුමට සරිලන පරිද්දෙන් හා තාක්ෂණික අභියෝගයන්ට මුහුණ දිය හැකි අයුරින් සිසුන්ගේ දැනුම, කුසලතා, ආකල්ප හා නිර්මාණශීලී බව ඉහළ නැංවීමට අදාළව ක්‍රියාත්මක වන වැඩසටහන නම් කරන්න.

(viii) ශ්‍රී ලංකාවේ අධ්‍යාපනයෙහි ගුණාත්මකභාවය ඉහළ නැංවීම උදෙසා මූල්‍යමය සහන ණය (credit), ණය ආධාර (loan) ලබාදෙන ප්‍රධාන බහුපාර්ශ්වීය සංවර්ධන පාර්ශ්ව ආයතන දෙක නම් කරන්න.

(ix) අධ්‍යාපන ලේකම්ගේ 2017 නොවැම්බර් 27 දාතම අංක 44/2017 චක්‍රලේඛය මගින් සියලුම පාසල් සඳහා හඳුන්වා දී ඇති 2018 - තිරසාර කියවීම් ප්‍රවර්ධන වැඩසටහන නම් කරන්න.

(x) ඉගෙනීමේ සාධකය හා අධ්‍යාපනයෙහි ගුණාත්මකභාවය, සහතිකකරණය හා ප්‍රමිතිකරණය සඳහා නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යෝජනා යටතේ පිහිටුවීමට යෝජිත ආයතනය නම් කරන්න.

*(ලකුණු 04 × 10 = 40 යි)*

**2.** අධ්‍යාපන ප්‍රතිසංස්කරණ හා ඇගයීම් හා තක්සේරුකරණයෙහි කාලීන ප්‍රවණතා පාදක කරගනිමින් වඩාත් ඵලදායී ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලිය ශක්තිමත් කිරීමේ අරමුණින් පාසල පදනම් කරගත් තක්සේරුකරණ (school based assessment) ක්‍රියාවලිය 2017 වර්ෂයේ සිට නව මුහුණුවරකින් ක්‍රියාත්මක වේ.

(i) 'පාසල පදනම් කරගත් තක්සේරුකරණය' යන්න කෙටියෙන් පැහැදිලි කරන්න. *(ලකුණු 07 යි)*

(ii) මෙම තක්සේරුකරණ වැඩසටහන විධිමත්ව ක්‍රියාත්මක කිරීම මගින් සිසුන්ට අත්වන ප්‍රතිලාභ/වාසි කවරේ දැයි කෙටියෙන් පැහැදිලි කරන්න. *(ලකුණු 08 යි)*

**3.** අධ්‍යාපනික, ආර්ථික හා සාමාජීය වශයෙන් වෙනස් වන හා කඩිනමින් සංවර්ධනය වන ලෝකයේ අවශ්‍යතාව හා ඉල්ලුමට සරිලන පරිද්දෙන් ගුරු භූමිකාව වෙනස් වෙමින් සංවර්ධනය විය යුතුය.

(i) 21 වන සියවසේ ගුරුවරයා සතු කුසලතා **තුනක්** කෙටියෙන් පැහැදිලි කරන්න. *(ලකුණු 06 යි)*

(ii) ගුරුවරුන් සඳහා එම කුසලතා වැඩි දියුණු කරගැනීමට ඔබ කරන යෝජනා **තුනක්** කෙටියෙන් පැහැදිලි කරන්න. *(ලකුණු 09 යි)*

[ 2 වැනි පිටුව බලන්න.

Department of Examinations, Sri Lanka

TO BE PUBLISHED IN THE WEBSITE OF DOE

**4.** ඉගෙනුම් ප්‍රාප්ති මට්ටම් ඉහළ නැංවීම හා සම්පත් උපයෝජනයෙහි කාර්යක්ෂමතාව ඉහළ නැංවීමට පාසල් පාදක කළමනාකරණය පිටිවහලක් වේ.

(i) පාසල් පාදක කළමනාකරණයෙහි දී බහුල වශයෙන් යොදාගනු ලබන ආකෘති (model) **හතර** නම් කර, ඉන් **එකක්** කෙටියෙන් පැහැදිලි කරන්න. *(ලකුණු 07 යි)*

(ii) පාසල් පාදක කළමනාකරණය හරහා අත්පත් කර ගත හැකි ප්‍රධාන වාසි **හතරක්** කෙටියෙන් පැහැදිලි කරන්න. *(ලකුණු 08 යි)*

**5.** 2030 තිරසාර සංවර්ධන ඉලක්ක යටතේ 4 වන අභිමතාර්ථයට අයත් වන අධ්‍යාපනය සම්බන්ධයෙන් ඉලක්ක ගණනාවක් හඳුනාගෙන ඇත.

(i) එම ප්‍රධාන ඉලක්කයට ගැනෙන ප්‍රධාන ක්ෂේත්‍ර **තුනකි**. එම ක්ෂේත්‍ර **තුන** දක්වන්න. *(ලකුණු 06 යි)*

(ii) තිරසාර සංවර්ධන අභිමතාර්ථ 4 යටතේ අධ්‍යාපනයට අදාළව 2030 දී ළඟා කර ගත යුතු ලෙසට හඳුනා ගෙන ඇති ප්‍රධාන ඉලක්ක කෙටියෙන් පැහැදිලි කරන්න. *(ලකුණු 09 යි)*

**6.** සිසුන්ගේ ඉගෙනුම් ප්‍රාප්ති මට්ටම් ඉහළ නැංවීමට හා ස්වයං අධ්‍යයනය සඳහා නවීන තාක්ෂණය හරහා සිදුවන බලපෑම සම්බන්ධයෙන් විවාදාත්මක මත ඉදිරිපත් වී ඇත.

(i) නවීන තාක්ෂණය, ඩිජිටල්කරණය, ඊ-ඉගෙනුම භාවිතය මගින් සිසුන්ගේ සාධන මට්ටම් ඉහළ නැංවීමට ධනාත්මක වන බලපෑම් **දෙකක්** හා සෘණාත්මක වන බලපෑම් **දෙකක්** කෙටියෙන් පැහැදිලි කරන්න. *(ලකුණු 08 යි)*

(ii) නවීන තාක්ෂණය, ඩිජිටල්කරණය, ඊ-ඉගෙනුම භාවිතය මගින් සිසුන්ගේ ඉගෙනුම් ප්‍රාප්ති මට්ටම් ඉහළ නැංවීමට ඔබ කරන යෝජනා **තුනක්** කෙටියෙන් පැහැදිලි කරන්න. *(ලකුණු 07 යි)*

**7.** තිරසාර සාමය ඇති කිරීමේ අරමුණු අත්පත් කරගැනීමට මූලික පදනම අධ්‍යාපනයයි.

(i) තිරසාර සාමය ස්ථාපිත කිරීම සඳහා ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ක්ෂේත්‍රය හරහා ගෙන ඇති ක්‍රියාමාර්ග **තුනක්** කෙටියෙන් පැහැදිලි කරන්න. *(ලකුණු 06 යි)*

(ii) සමාජ සංහිඳියාව හා ඒකාග්‍රතාව තිරසාර ලෙස පවත්වාගෙන යාමේ දී අධ්‍යාපන ක්ෂේත්‍රය හරහා ගත හැකි ක්‍රියාමාර්ග **තුනක්** කෙටියෙන් පැහැදිලි කරන්න. *(ලකුණු 09 යි)*

***

Department of Examinations, Sri Lanka